**මහඔය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 06 දින සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**--------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ එකතුව රු.5,029,183 ක් ලෙස වටිනාකමක් දක්වා තිබුණ ද ලෙජරය අනුව කිසිදු වටිනාකමක් දක්වා නොතිබුණි.

(ආ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙනත් ආදායම් වල එකතුව රු.328,368 ක්වූ අතර, ආදායම් හා වියදම් ගිණුමේ එය රු.345,983 ක් ලෙස රු.17,615 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරය අනුව හිඟ හිටි මුද්දර ගාස්තු රු.286,600 ක් වුව ද, එය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ රු.127,363 ක් ලෙස රු.159,237 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වෙනත් ආධාර වල එකතුව රු.7,576,696 ක් වූ අතර, එය ආදායම් හා වියදම් ගිණුමේ රු.7,624,909 ක් ලෙස රු.48,213 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු ආදායම රු.408,650 ක් වූ අතර, ආදායම් හා වියදම් ගිණුමේ රු. 420,800 ක් ලෙස රු.12,150 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය සඳහා කුලී ආදායම රු.4,127,500 ක් වූ අතර, ආදායම් හා වියදම් ගිණුමේ රු.4,124,500 ක් ලෙස රු.3,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

---------------------------------------

රු. 22,459,274 ක වටිනා ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

-----------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| **(අ)** 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු විශේෂ විධි විධාන පනත | 2014 දෙසැම්බර් 31 දිනට රු.88,925 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** ප්‍රාදේශීය සභා රීති මාලාව - රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි - 757 (2) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කර න ලද සමුල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,765,286 ක් වූ අතර එයට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,103,267ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.662,019ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**------------------------------------**

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම, බලපත්‍ර ආදායම, වරෙන්තු ගාස්තු හා දඩ මුදල් ආදායම සියයට 16 සිට සියයට 81 ක් දක්වාවූ පරාසයක වැඩිවීමක් ද, සේවා සඳහා ගාස්තු හා වෙනත් ආධාර සියයට 11 සිට සියයට 27 ක දක්වා වූ පරාසයක අඩුවීමක්ද පෙන්නුම් කරයි.

(ආ) පුනරාවර්තන වියදම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා, ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව, ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර හා විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත යන වියදම් වල සියයට 9 සිට සියයට 95 දක්වා පරාසයක වැඩිවීමක් පෙන්නුම් කරයි.

**2.3 ආදායම් පරිපාලනය**

**---------------------**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

**-------------------------------------------------------------**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,000 | 28,200 | - |
| (ii) | බලපත්‍ර ගාස්තු | 459,000 | 4,124,500 | - |
| (iii) | කුලී | 3,254,370 | 420,800 | 637,675 |
| (iv) | වරෙන්තු ගාස්තු හා දඩ | 309,000 | 1,479,708 | 53,166 |
| (v) | වෙනත් ආදායම | 9,903,336 | 1,479,708 | |
| (vi) | වෙනත් ආධාර | | 345,983 | 358,863 |

**2.3.2 මුද්දර ගාස්තු**

2014 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.127,363 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතුව වාහන 15 ක් පවතින අතර, ඉන් වාහන 05 ක් දැනට භාවිතයට ගනු නොලබන අතර, එම වාහන අළුත්වැඩියා කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය තුල නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.22,259 ක ණය ශේෂය වසර 2 සිට වසර 8 දක්වාවූ කාල පරාසයක් තුල අය නොවී පැවතින. මෙම ණය මුදල අය කර ගැනීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සභාපති විසින් 2012 වර්ෂයට පෙර සුභ සාධක සංගමයට වැඩිපුර ගෙවූ රු.15,070 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉන්වෙන්ට්‍රි හා ගබඩා අයිතම භෞතික පරීක්ෂාවේදී Auto Level කණ්නාඩි 03 ක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය